// emblem omitted (logo)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1770/14 – 2012 අගෝස්තු 08 වැනි බදාදා – 2012.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ව/18/82/2008.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, එපාමුල්ල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම් 3821 හා 2012.07.03 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5217 ක් පමණ වූ පහත සඳහන් විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වෙරළබඩතල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි තුනක් සහ අත්තිවාරමක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 3; ප්‍රමාණය: හෙක් 0.5217.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 අගෝස්තු මස 30 වැනි දින පූ.භා 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 අගෝස්තු මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2012 අගෝස්තු මස 03 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 – 657

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: කැප්‍රාලේ/අත්3/1/69.

රාජ්‍ය බුද්ධි සේවා නිලධාරීන්ගේ නේවාසිකාගාරය සඳහා නිවසක් සහිත ඉඩමක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535, පැපිලියාන බටහිර ග්‍රාම නිලධාරී වසමේ, පැපිලියාන ගමේ පිහිටි මූලික පිඹුරු අංක කො. 9214 හි සඳහන් කැබලි අංක 1:

ඉඩමේ නම: කෝන්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ටී. ජී. සී. ඒ. ඩයස්, අංක 24/2, දෙහිවල පාර, පැපිලියාන; ප්‍රමාණය: හෙක් 0.0359.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 සැප්තැම්බර් මස 10 වැනි දින පූ.භා 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 සැප්තැම්බර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2012 අගොස්තු මස 03 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 – 658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.